THE GOVERNMENT MEDICAL OFFICERS' ASSOCIATION
GMOA
ESTABLISHED IN 1926
TU No. 291
No.275/75, Professional Centre, Prof. Stanley Wijesundara Mawatha, Colombo 07
Tel : 2580886 / 0714 999555
Fax : 4518668 / 2503586
Web : www.gmoa.lk
Email : info@gmoa.lk
office@gmoa.lk

2014/01/11

## මාධ්‍ය නිවේදනයයි

### අධ්‍යාපන සුදුසුකම් නැති ඇපෝතිකරිවරුන් වෛද්‍ය ලියාපදිංචිය ඉල්ලා සිටීම

ඇපෝතිකරිවරුන් ලෙස රාජ්‍ය සේවයට බඳවා ගත් පිරිස් නිසි අධ්‍යාපන සුදුසුකම් ලබා ගැනිමකින් තොරව සහකාර වෛද්‍යවරු යන නාමය ලබාගෙන ඇත. මෙම පිරිස රෝහල්තුල සිමිත වගකිම් දරමින් සිටින අතර මෙවැනි වෘත්තිකයන් පිරිසක් ලෝකේ වෙනත් කිසිදු රටක දක්නට නැත. මෙම පිරිස් තම අධ්‍යාපනික සුදුසුකම් ඉහල නංවා ගැනිමටයයි පවසමින් වසර 06 ක වෛද්‍ය උපාධි පාඨමාලාවක් කඩිනම් නේවාසික පාඨමාලාවක් ලෙස හැදෑරීමට පඩි සහිත නිවාඩු ලබා ගෙන තිබුණද අදාල කාලය තුල පාඨමාලාවක් හැදෑරිම වෙනුවට සිය පෞද්ගලික වෛද්‍ය සේවයේ යෙදුන බවට අපරාධ පරික්ෂණ දෙපාර්තමේන්තුව හා සෞඛ්‍ය අමාත්‍යාංශය මගින් පැවැත්වූ පරික්ෂණවලදි තහවුරු වී ඇත.

අදාල වාර්තාවල සඳහන් පරිදි මොවුන් මාස 06ක පමණ කාලයක් විදේශගතව සිට ඉතිරි කාලය ලංකාවේ පාඨමාලාව හැදෑරූ බවට සඳහන් කර ඇතත්, එම ස්ථාන ඉන්ධන පිරවුම්හලක් හා පෞද්ගලික නිවාසයක් බවට තහවුරු වී ඇත. තත්ත්වය මෙසේ තිබියදි මේ සම්බන්ධව සෞඛ්‍ය අමාත්‍යාංශය, අපරාධ පරික්ෂණ දෙපාර්තමේන්තුව හෝ වෛද්‍ය සභාව මේ ව්‍යාජ ලිපි ලේඛණ ඉදිරිපත් කල පිරිසට විරුද්ධව කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබීම විමතියට කරුණකි.

මේ අනුව අදාල පිරිසට විරුද්ධව විනයානුකූල පියවර ගන්නා ලෙස සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් ඉල්ලා සිටීමටත් මොවුන්ගේ නිති විරෝධී ක්‍රියා හේතුවෙන් ඔවුන්ගේ ලියාපදිංචිය අවලංගු කරන ලෙස වෛද්‍ය සභාවෙන් ඉල්ලා සිටීමටත් රජයේ වෛද්‍ය නිලධාරින්ගේ සංගමය තිරණය කර ඇත.

ස්තුතියි

වෛද්‍ය සමන් අබේවර්ධන
ලේකම්

| | | | |
|---|---|---|---|
| වැඩිදුර විස්තර සඳහා : | වෛද්‍ය නවීන් සොයිසා | - | 0718582444 |
| | වෛද්‍ය නලින්ද හේරත් | - | 0717876516 |